මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| නාට්‍ය හා රංග කලාව - I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

සැලකිය යුතුයි.

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1-40 තෙක් දී ඇති 1,2,3,4, පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ නියමිත ප්‍රශ්න අංකයට හිමි උත්තරයෙහි අංකය හා සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
  මුළු ලකුණු (1×40) 40 යි.

පහත දැක්වෙන ගීත හෝ දෙබස් කාණ්ඩ ආශ්‍රයෙන් 1-6 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - ආල වෙලා පියසේ පටන්
මම කෝල නැතිව සබයේ මෙ දැන්

B - ගම්භීර තෙදැති කොන්තන්ත්නු පුරේ
පූර වර්ධනකරන අග නර නා මෙමං

C – අනේ ගුරුන්නාන්සේ මේ කණ්නාඩියෙන් මුකුත්ම පේන්නේ නැනේ
හොඳට බලනවා එතකොට පෙනේවි.
(කණ්ණාඩිය ඔසවා බලමින්) මේ කණ්ණාඩියෙන් මට තවත් දෙයක් පේනවා සමහරු දරුවෝ එක්ක හිනා වෙනවා, සමහරු දරුවො නැතිව දුකින් ඉන්නවා.....

D - නැත පියාණෙනි කිසිදු මන දොළ
සබා වුව මැන දොසක් වී නම්

E - සවන් දී පෙර රාම චරිතේ අසවි....

1. ඉහත දැක්වෙන ගීත හෝ දෙබස් කාණ්ඩ අතරින් ශාන්ති කර්මයට අයත් වෙන්නේ,
   1.) A 2.) B 3.) C 4.) D
2. එම ශාන්ති කර්මය වන්නේ,
   1.) සූනියම් යාගය 2.) සන්නි යකුම 3.) රට යකුම 4.) කොහොඹා කංකාරිය
3. නූර්ති නාට්‍යයකට අයත් වන්නේ,
   1.) A 2.) B 3.) C 4.) D
4. කොළම් වලට අයත් වන්නේ,
   1.) B 2.) C 3.) D 4.) E
5. D වලින් දැක්වෙන ගී දෙපදය අයත් නාට්‍ය වන්නේ,
   1.) මනමේ 2.) කුවේණි 3.) සිංහබාහු 4.) නරිබෑණා

6. ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ විකාශය පිළිවෙලින් පෙන්නුම් කරන්නේ,
    1.) ABCDE 2.) CABED 3.) BACDE 4.) CDEAB

- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

7. ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ජීවමානව ඉදිරිපත් කරනු ලබන කලාව හඳුන්වන්නේ මේ නමිනි,
    1.) නාටය කලාව 2.) ශ්‍රවය දෘශ්‍ය කලාව 3.) රංග කලාව 4.) ප්‍රාසාංගික කලා

8. සංගීත සංදර්ශනයක,
    1.) ප්‍රාසාංගික ලක්ෂණ නැත.
    2.) නර්තනය මුසුකර ගැනීම පමණක් ප්‍රාසාංගික ලක්ෂණයක් වේ.
    3.) ප්‍රාසාංගික ලක්ෂණ දක්නට ඇත.
    4.) ගායනය ප්‍රාසාංගික බවට අයත් නැත.

9. වේදිකා නාට්‍ය කලාව,
    1.) සියළු ප්‍රාසාංගික කලාවන්ගෙන් පෝෂණය වූ පරායත්ත කලාවකි.
    2.) වෙනත් කලා මාධ්‍යන් වලට සමාන කලාවකි.
    3.) සාහිත්‍ය රසය සුවිශේෂී විය යුතු කලාවකි.
    4.) රූපණය පමණක්ම වැදගත් වන්නා වූ කලාවකි.

10. රංගාලෝකකරණය අවශ්‍ය වන්නේ,
    1.) ප්‍රොසීනියම් වේදිකාවක අඳුර පලවා හැරිම සඳහාය.
    2.) නාට්‍යයේ ගලායාම සඳහා නිර්මාණාත්මකව සුවිශේෂිව උපයෝගි කර ගැනීමටය.
    3.) ප්‍රේක්ෂකයන්ගේ පහසුව සඳහාය.
    4.) රංගාලෝක ශිල්පියෙකුගේ දායකත්වය සපයා ගැනීම සඳහාය.

11. වේදිකා සැරසිලි ,අංග චලන,දෙබස්,කෝපය යනාදියට අදාළ අභිනය සතර පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ,
    1.) වාචික , ආංගික , සාත්වික , ආහාර්ය
    2.) සාත්වික , ආංගික , වාචික , ආහාර්ය
    3.) වාචික , සාත්වික , ආංගික , ආහාර්ය
    4.) ආහාර්ය , ආංගික , වාචික , සාත්වික

12. ගායනය මූලික වන්නේ මේ අතරින් කුමක්ද?
    1. නෘත්‍ය 2. ඔපෙරාව 3. ඉඟිනළු 4. නූර්ති

13. අංග වික්ෂේප පමණක් ඇති රිද්මයානුකූල නැටුමකි,
    1. නෘත්‍ය 2. නූර්ති 3. මුද්‍රා නාට්‍ය

14. වේදිකා අවකාශය තුළ නළු නිළියන් ස්ථාන ගත කරවන ආකාරය හඳුන්වන්නේ මේ නමිනි,
    1. රංග ආකෘතිය 2. රංග අභ්‍යාසය 3.රංග වින්‍යාසය 4. රංග ශෛලිය

15. බඹරු ඇනීමකින් බේරීමට දැහලීම යන ක්‍රියාකාරකම අයත් රංග අභ්‍යාසය වන්නේ,
    1. ශිථිලක්ෂණ අභ්‍යාසය    2. සංවේදන අභ්‍යාසය
    3. තාපන අභ්‍යාසය    4. ශ්වසන අභ්‍යාසය

16. දර්පණ අභ්‍යාස මගින් රූපණ ශිල්පියෙකුට ගොඩ නගා ගැනීමට උපකාර වන්නේ,
    1.) සබකෝලය දුරුවීම.
    2.) ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව.
    3.) සාත්වික අභිනය ප්‍රගුන වීම.
    4.) අනෝන්‍ය සුහද බව ප්‍රගුණ වීම.

17. ආලෝක කරණයේදී අවස්ථාවන්ට උචිත පරිදි වර්ණයන් යොදා ගැනීම සඳහා භාවිතා කරණ ආලෝක උපකරණය වන්නේ,
    1.) බැටින් ලාම්පු  2.) වර්ණ චක්‍රය  3.) ඩීමරය  4.) අල්ට්‍රාවයලට් ලාම්පු

18. වර්ණ සමග කටයුතු කරන ශිල්පීන් වන්නේ,
    1.) අංගරචන ශිල්පියා හා වේෂ භූෂණ ශිල්පියා.
    2.) රංගාලෝක ශිල්පියා හා පසුතල නිර්මාණ ශිල්පියා.
    3.) වේශ භූෂණ ශිල්පියා හා රංගාලෝක ශිල්පියා.
    4.) ඉහත සඳහන් ශිල්පීන් හතර දෙනාම.

19. අංග රචන ශිල්පියෙකු වැඩියෙන්ම දැනගත යුත්තේ,
    1.) නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ දර්ශනය පිළිබඳවය.
    2.) නාට්‍ය පිටපත පිළිබඳවය.
    3.) නාට්‍ය අයත් වන්නේ කුමන කාලයකටද යන්න පිළිබඳ.
    4.) පින්සල් මගින් වර්ණ රේඛා නිවැරදිව හැසිරවීම පිළිබඳ.

20. මේ අතරින් අංග රචනා ශිල්පියෙකු වන්නේ,
    1.) ජයන්ත රණවක මහතා
    2.) සරත් සූරසේන මහතා
    3.) රංජිත් ධර්මකීර්ති මහතා
    4.) ලයනල් එදිරිසිංහ මහතා

- 21-25 දක්වා ප්‍රශ්නවල නොගැලපෙන පිළිතුර තෝරන්න.

21. නාට්‍ය සංගීතය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
    1.) නාට්‍යයේ ශෛලියට අනුව සංගීතය යොදාගත යුතු වේ.
    2.) නාට්‍ය ධර්මී ශෛලියේ නාට්‍යවල සංගීතය සුවිශේෂී වේ.
    3.) නාට්‍ය සංගීතය අයත්වන්නේ වාචික අභිනයටය.
    4.) ලෝක ධර්ම නාට්‍යවල සංගීතය අනිවාර්ය අංගයක් නොවේ.

22. රංගභූමි අලංකරණයේදී,
    1.) රංගභූමි අලංකරණය සහිතව මෙන්ම රහිතවද නාට්‍යයක් ඉදිරිපත් කල හැක.
    2.) රංගභූමි අලංකරණය සංකේතාත්මකව ද ඉදිරිපත් කළ හැකිය.
    3.) රංගභූමි අලංකරණයේදී ස්ලයිඩස්,ප්‍රක්ෂේපන වැනි විවිධ තාක්ෂණයන්ද භාවිතා කළ හැක.
    4.) රංග භූමි අලංකරණය ප්‍රේක්ෂක ආකර්ෂණය ලැබෙන පරිදි නිර්මාණය කරන ලද හුදු සැරසිල්ලකි.

23. ප්‍රේක්ෂකයා,
    1.) රසවිඳින්නෙකු මෙන්ම විචාරකයෙක්ද විය යුතුය.
    2.) විචාරකයෙකු මෙන්ම විනිශ්චයකරුවෙක්ද විය යුතුය.
    3.) නාට්‍ය දර්ශනයකට ප්‍රේක්ෂකයා අවශ්‍යය.
    4.) ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක බාධාකාරී අංගයක් වේ.

24. ක්ෂණික නිරූපණයකදී,
    1.) ක්ෂණික නිරූපණයක් සිදු කරනුයේ පිටපතකින් තොරවය.
    2.) ක්ෂණික නිරූපණයක් තනිව හෝ සාමූහිකව සිදු කළ හැක.
    3.) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම අවශ්‍යය.
    4.) ක්ෂණික නිරූපණ හැකියාව නළුයෙකුට ප්‍රයෝජනවත් නොවේ.

25. අභිරූපණ රංගනයකදී,
    1.) සාත්වික අභිනය වැදගත් වේ.
    2.) ආංගික අභිනය මූලික වේ.
    3.) වාචික අභිනය භාවිතා නොවේ.
    4.) යම්කිසි සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වේ.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සිට 28 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.





26. ඉහත A , B යන වෙස් මුහුණු අනුපිළිවෙලින්,
    1.) සන්නි මුහුණක් හා කෝළම් මුහුණකි.
    2.) කෝළම් මුහුණක් හා සන්නි මුහුණකි
    3.) සන්නි මුහුණු දෙකකි.
    4.) කෝළම් මුහුණු දෙකකි.

27. A  වලින් දැක්වෙන්නේ,
    1.) ජස කෝළමය.
    2.) කණ සන්නිය.
    3.) මුදළි කෝළමය.
    4.) කොර සන්නිය.

28. B වලින් දැක්වෙන්නේ,
    1.) ජස කෝළමය.
    2.) කණ  සන්නිය.
    3.) මුදළි කෝළමය.
    4.) කොර සන්නිය.

29. රතදර සිරියා පරදන රූපෙට වටිනා.......මෙම ගීතය අයත් නාට්‍යය වන්නේ,
    01) සිංහබාහු ය.
    02) රතු හැට්ටකාරි.
    03) මනමේ ය.
    04) එළොව ගිහින් මෙලොව ආව.

30. එම ගීතය ගයන චරිතය වන්නේ,
    1.) සුප්පා දේවිය.
    2.) දික්තලා.
    3.) මනමේ කුමරිය.
    4.) කළුහාමි.

- පහත වගුව ආශ්‍රයෙන් 31 – 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

| ද පබ්ලික් එනිමි | හෙන්රික් ඉබසන් | ක | සුනන්ද මහේන්ද්‍ර |
|---|---|---|---|
| ග | ප්ලෝටස් | කඩය | බන්දුල ජයවර්ධන |
| ඉක් හෙව්ටාඉ | සොෆොක්ලීස් | ජ | බන්දුල ජයවර්ධන |
| ද චෙරි වාර්ඩ් | ඇන්ටන් චෙංකව් | ට | රංජිත් ධර්මකීර්ති |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසි විලියම්ස් | අහස් මාලිගා | ඩ |

31. වගුවේ “ක” කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,
    1.) කඩය
    2.) ජනහතුරා
    3.) බෙර හඬ
    4.) සකලපන

32. වගුවේ “ග” කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,

1.) යෙර්මා
2.) රුඩව්ස්
3.) ද ෆාදර්
4.) ද බ්‍රැගන්

33. වගුවේ “ජ” කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,

1.) ද බ්‍රැගන්
2.) වෙස්මුහුණු බෙර හඬ
3.) කපුවා කපෝති

34. වගුවේ “ට” කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,

1.) මහගෙදර
2.) වෙරිවත්ත
3.) බෝනික්කි ගෙදර
4.) සයුරෙන් ආ ලඳ

35. වගුවේ “ඩ” කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,

1.) සුගතපාල ද සිල්වා
2.) ගුණසේන ගල්පත්ති
3.) ධම්ම ජාගොඩ
4.) හේන්රි ජයසේන.

- පහත ඡායාරූප ඇසුරෙන් 36 සිට 39 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.






36. ගුරු තරුව නාට්‍ය නිර්මාණය සම්බන්ධ වන්නේ,

1.) A 2.) B 3.) C 4.) D

37. ජනේලය, කුවේණි වැනි නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1.) A 2.) B 3.) C 4.) D

38. විකෘති නාට්‍යයේ මුල් නිෂ්පාදනය හා සම්බන්ධ වන්නේ,

1.) A 2.) B 3.) C 4.) D

39. කැළණි පාලම වේදිකා නිට්‍ය සඳහා රංගනයෙන් දායක වන්නේ,

1.) A 2.) B 3.) C 4.) D

40. මිනර්වා නාට්‍යයේ හෙවත් බී.ඒ.ඩබ්ලිව් ජයමාන්නගේ නාට්‍යයක් වන්නේ මින් කුමක්ද?

1.) රොඩී කෙල්ල.
2.) පිටිසර කෙල්ල.
3.) වැරදුනු කුරුමානම.
4.) බහින කලාව.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන2020 -

| නාට්‍ය හා රංග කලාව - **II** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 02 යි** |
|---|---|---|

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළු ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

01. 1.) විකෘති නාට්‍යය කුමන දශකයක සමාජ පසුබිම අලලා නිෂ්පාදනය වූවක්ද? (ලකුණු 02)
2.) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතය කුමක්ද? (ලකුණු 02)
3.) එම චරිතයේ අවසාන ඉරණම කුමක්ද? (ලකුණු 02)
4.) එම චරිතය එවැනි තත්වයකට පත්වීමට බලපෑ මූලික සංසිද්ධිය කුමක්ද? (ලකුණු 02)
5.) මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුමට හෙතුවන චරිත 2 නම් කරන්න. (ලකුණු 02)
6.) නාට්‍යයේ අවසානයේ ගැයෙන ගී කණ්ඩයේ මුඛ්‍ය අර්ථය ලියන්න. (ලකුණු 02)

02. 1.) වේෂ භූෂණය අයත් වන්නේ කුමන අභිනයටද? (ලකුණු 03)
2.) වේෂ භූෂණ නිර්මාණයේදී ශිල්පියෙකු සැලකිලිමත් විය යුතු කරුණු මොනවද? විස්තර කරන්න. (ලකුණු 04)
3.) නාට්‍යයකට වේෂභූෂණ යොදා ගැනීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05)

03. 1.) රංග භූමිය යනු කුමක්ද? (ලකුණු 03)
2.) රංග භූමි වර්ග 4ක් නම් කරන්න. (ලකුණු 04)
3.) රංග භූමියක තිබිය යුතු ලක්ෂණ 05ක් ලියන්න. (ලකුණු 05)

04. 1.) ශ්‍රී ලංකාවේ නාඩගම් කලාව ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු03)
2.) ශ්‍රී ලංකාවේ නාඩගම් ප්‍රභවය වූ ආකාරය සඳහන් කරන්න. (ලකුණු 04)
3.)නාඩගම් රංග ශෛලියේ සුවිශේෂිතා පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

05.1.) රංගභූමි ආලෝකකරණය යනු කුමක්ද? (ලකුණු 02)
2.) රංගභූමි ආලෝකකරණයට යොදා ගන්නා පහන් වර්ග 2ක් ඇඳ නම් කරන්න. (ලකුණු 04)
3.) රංගභූමි ආලෝකකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් විස්තර කරන්න. (ලකුණු 06)

06. 1.) උඩරටට හා පහතරටට ආවේනික ප්‍රධාන ගැමි නාටක 2 ක් නම් කරන්න. (ලකුණු 03)
2.) එකී ගැමි නාටකවල ප්‍රධාන අරමුණු හෙවත් පරමාර්ථ 3 බැගින් ලියන්න. (ලකුණු 04)
3.) මෙම ගැමි නාටකවල රංග ශෛලිටය් විශේෂ ලක්ෂණ 05 බැගින් ලියන්න. (ලකුණු 05)

07.1.) නූර්ති නාට්‍ය සම්ප්‍රදාය හා සම්බන්ධ නාට්‍ය රචකයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)
2.) ඔවුන් තිදෙනා විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04)
3.) නූර්ති නාට්‍ය රංග ශෛලියේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 4ක් විස්තර කරන්න. (ලකුණු 05)

08. එදින ඔබේ උපන් දිනයයි. උදේ පාන්දරම කූරියර් සර්විස් එකකින් පැමිණෙන පුද්ගලයෙක් ලොතරැයියකින් ඇදුණු ත්‍යාගයක් ලෙස පවසා ඔබේ අතට පාර්සලයක් දී යයි.මෙතැන් සිට නාට්‍යමය අවස්ථාවක් ගොඩනැගෙන ලෙස කෙටි නාට්‍යයක් නිර්මාණය කරන්න. (ලකුණු 12)